


# තෝරන් සති - සමතෙක් නම්

"කොහෙද ඉතින්! මේ ලෝකේ මනුස්සයෙකුට තේරුම් ගන්න පුලුවන් දෙයක් යැ ගියපාර ඇඳලා දුන්නේ.... " පන්හිඳ මැසිවිල්ලක් පටන් ගත්තා.
"තේරෙන දෙයක් අඳින්න තේරෙන දෙයක් ලියන්න එපායෑ! " පින්සලත් ගාණකට නොගෙනම කියලා ඇරියා."
"තේරවිලි ගැන තේරෙන්න ලියන්න පුළුවන්ද? තේරුණෝ නැති කෙනෙකුට තෝරලා දෙන එක වෙනම වැඩක්."
"එහෙම නං ඉතින් ඒකවත් කරමුකෝ බලන්න මෙදා පාර" පින්ගෙ කතාවටය පන්ට මතක් වුණෝ ගිය පාර ලියපු සමහර තේරවිලි තේරුවෙ නෑ නේද කියලා..

ගොහොරු වේල්ල
ගොහොරු නම් - මඩ
වේල්ල නම් - කණ්ඩිය - මඩ කණ්ඩිය- කඩමණ්ඩිය

තඩි කාලය
තඩි නම් - මහ
කාලය නම් - කල -මහ කල - කහ මල

තමන් විසප්පුව
තමන් නම් - මම්
විසප්පුව නම් - ගඩුව - මම් ගඩුව - ගම් මඩුව

දන්ත යහළු
දන්ත නම් - දත
යහළු නම් - සහයු - දත සහය - සත දහය

ආරණ්‍ය ප්‍රමාද
ආරණ්‍ය නම් අරණ
ප්‍රමාද නම් - පරක්කු - අරණ පරක්කු
- පරණ අරක්කු

ඇත්තු ගස්ලනවා
ඇත්තු නම් - අලි
ගස්ලනවා නම් - බඳිනවා - අලි බඳිනවා
- බලි අඳිනවා

කැලෑ මුගුර
කැලෑ නම් - වල්
මුගුර නම් - පොල්ල
වල් පොල්ල - පොල් වල්ල

කුසුම් දණ්ඩ
කුසුම් නම් - මල්
දණ්ඩ නම් - පොල්ල
මල් පොල්ල - පොල් මල්ල

රැහැන් කුසුම්
රැහැන් නම් - වැල්
කුසුම් නම් - මල්
වැල් මල් - මල් වැල්

ගඳ පොට්ට
ගඳ නම් - පල්
පොට්ට නම් - කනා - පල් කනා - කල්පනා

කල්පනා කලොත් තමන්ටද මෙවැනි තුන් තේරවිලි ගෙතිය හැකි නොවේද? විසඳුම සඳහා කියවෙන පද යුගලයෙන් අරඹා ආපස්සට අර්ථයන් පිරීම පහසු විය හැකිය. තේරවිලි පිළිබඳව සන්නසට ලියූ ලිපි පෙළෙහි අවසාන ලිපියයි මේ. මුල් ලිපි පළවූයේ කලකට ඉහත දී වන බැවින් ඒ ලිපිවල ඇතුළත් වූ තේරවිලි වර්ග පිළිබඳවද සැකෙවින් සිහිපත් කිරීම සුදුසු යැයි හැඟේයි. එසේ වුවද ඒ පිළිබඳව මතකයේ ඇති පාඨකයිනට නීරස නොවීම සඳහා එම ලිපිවල අඩංගු නොවූ නිදසුන් ගෙනහැර දැක්වීම වඩාත් යෝග්‍ය වනු ඇත.
පද පෙරළිය (අකුරු පෙරළිය) සඳහා නිදසුන් කීපයකි මේ.
පුර පර - පරපුර, මදවල - වදමල, කොට පිටුව - පිටකොටුව, කතල් පර්මාන්තය - පතල් කර්මාන්තය, පොට්ටි හෙළ - හෙට්ටිපොළ, කංහල සිවිය - සිංහල කවිය.
සිංහල කවියේ ගුණ සුවඳ ළං කර ගන්නට රිසිවුණ තේරවිලි නිර්මාතෘවරුන්ගේ මුල්ම උත්සාහයන්ගේ පළයන් කීපයකි මේ.

සාක්කුවෙන් පිටට පනී
පස් දෙනෙකුම බදා ගනී - ලේන්සුව

අත්වලින් අඳිනවා - දත්වලින් දුවනවා

කකා බිම හලනවා - කවුද මේ ?
කියනවා - කියත

පියා සළයි - ඉහළ නොයයි
හිත රිදුනොත් මෙයා අඬයි - ඇස

වැකියකින් විමසනු ලබන පැණයක් ලෙසින් ඉදිරිපත් කෙරෙන තේරවිළි කීපයකි මේ.
පිරිසිදු කළාම කළු පාටයි - කළු ලෑල්ල
රැඳුනොත් එන්න අපහසු මඟ - අතරමඟ
දිය පිට - සුදු පිට - කටු පිට - ලොම් පිට - හම්පිට - කණ්පිට - අං : පොල්ගෙඩිය
කිසිවෙක් නොයා යුතු මඟ - නොමඟ

රසවත් මවන්, කුහුලත් කවිත්වය සමඟ මොනවට මුහු වූ තේරවිළි කවි යුගලයක්ද ඇතුළත් නොවූවහොත් මෙවර ලිපිය හරබර නොවනු ඇත.

සව් සරා සපිරි මුදුනේ වැඩෙන්නේ
නැව් පුරා රුවල් සුළඟට වැනෙන්නේ
ගව් ගණන් ගොසින් මහතුන් දකින්නේ
මව් මරා උපන් කුමරා කියන්නේ

සව් සරා සපිරි මුදුනේ වැඩෙන කල
නැව් පුරා රුවල් සුළඟට වැනෙන කල
ගව් ගණන් ගොසින් මහතුන් දකින කල
මව් මරා උපන් කුමරා කෙහෙල් මල



හෙළ ගැමි ජනයාගේ මුඛ වහරින් පැවත ගෙන ආ මෙවන් නිර්මාණාත්මක දායාදයෝ සිංහල සංස්කෘතියේ ප්‍රධාන අංගයෝ නොවෙත්ද? ඒ දේ ලේඛණගත කර මතු පරපුර වෙනුවෙන් දායාද කිරීමයි අපගේ යුතුකම වනුයේ. දරුවන් වෙනුවෙන් "මල්පියළි" ප්‍රකාශනයක් ලෙසින් ප්‍රේම් දිසානායකයන් විසින් ගොනු කළ "තේරවිලි 500 ක" පොත් පිංච එවන් අපූරු අගැයිය යුතු උත්සාහයකි. මෙම ලිපි පෙළ සම්පාදනයේදී නිදසුන් දැක්වීම සඳහා ඉන් ලද පිටිවහල මෙහිදී සිහිපත් කැරන්නෙ කෘතඥතාපූර්වකවය. අප උපතින්ම උරුම කරගත් මෙවන් දායාදයන් පරිහරණය කරමින් නව නිමැවුම් නිමැවීමයි නිර්මාණ කරුවන්ගේ වගකීම.
අනිත් අයගේ දේවල් අගය කරනවා වගේම තමන් අතිනුත් යමක් කරන්නත් පන් බොහෝම උනන්දුයි. "සකු බස" කියලා කියන සංස්කෘත භාෂාවෙන් සහ "පෙළ බස" කියලා කියන පාලි භාෂාවෙන් ආ තේරවිලි දෙකක් මුල් කරගෙන පන් අතින් ලියවුණ පද පෙළක් පන් මේ විදියට ලියලා ඇමිනුවා. "හෙළ බස" කියන්නේ සිංහල භාෂාවයි.

පළමු : පෙළ, සකු බස කවි සුපසන්
තෝරන් සකි සමතෙක්නම්
දෙවැනි :හෙළයට පෙරළා දෙයිනම්
තෝරම් නුඹේ කවි සුපසන්

පළමු :ළඳක මගේ කර වටකර අතලන්නා
හීන් සැරේ තුරුළට ළං කර ගන්නා
උකුල් තලේ පහසින් මං නළවන්නා
ආදරයේ රස ගී මට කියවෙන්නා

දෙවැනි :දියට ගිහින් දිය පිරුවී එන්නාය
දිය කලයක් කට මැත දොඩවන්නාය

පළමු :වළා නොවේ, දිය සිසිලස ගෙන දෙන්නා
සියොත් නොවේ , තුරු හිස්වල ලැග ඉන්නා
හිසක් නොවේ, කබලෙහි කෙහෙ රුඳවන්නා
ඉසුරු නොවේ, තිදැසින් ලොව විමසන්නා

දෙවැනි :කප්තුරු හිස සරුවට වැජඹෙන්නාය
වෑවරයක් ගැන නුඹ කියවන්නාය.

විටින් විට පන්ගේ ලියවිල්ලට එබිකම් කරන ගමන් පින්සලත් තමන්ගේ වැඩේ කළා. අපේ තවත් හොඳ සිංහල සංස්කෘතික අංගයක් ගල් කැටයම්. අතීතයේ දක්ෂ කලාකරුවකු අතින් නිර්මාණය වූණ අවලෝකේශ්වර කැටයම පින් රේඛා චිත්‍රයක් විදියට ඇන්දා. පහුගිය වතාවෙ පින් ඇන්දේ තේරවිල්ලක් තෝරගන්න බැරිව නළල රැළි ගන්නා ගෙන කල්පන කරන තෝරන්නෙකුගේ චිත්‍රයක්. ඒත් ඉතින් ඒක ඔයිට වඩා තෝරලා දෙන්නෙ කොහොමද කියලා නම් පින්ට තවම හිතා ගන්න බෑ.

TAX RETURNS
BAS & IAS
Bookkeeping
Tax Planning
Business Consultants

Sandal Financial & Tax Advisors

Amal Ramyanath
No. 47 Cypress Avenue
Glen Waverley
Vic 3150
* Special offer for Families

Phone: (03) 8802 8818
Fax: 8802 8818 Mob: 0412 775 889
Email: sandalmanagement@optusnet.com.au